# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
# පුරප්පාඩු දැන්වීමයි

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදායම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.**

**තනතුර - සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) (පුරප්පාඩු -01 යි)**

**සුදුසුකම් -:**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II සුදුසුකම් සපුරා තිබිය යුතුය)**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය හෝ ගණකාධිකරණය හෝ කළමණාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම

- පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක (ICASL, CIMA, ACCA, CMA ) අන්තර් මධ්‍යම මට්ටමේ පරීක්ෂණය සමත්වීම සමග රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන පිළිගත් ආයතනයක අදාළ කෂේත්‍රයේ මුදල් පිළිබඳව කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම

- 2022.01.01 දිනට වයස අවුරුදු 32 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**වැටුප් කේතය**

MM -1-3- රු.55,925 -10X 1375-15 X 1910 – 98,325 + කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

(ලිඛිත පරීක්ෂණයකින් හා/හෝ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.)

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාල කාලයන්හීදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුරු සඳහා අයදුම්පත් 2022 අගෝස්තු 31 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කිරීම අනිවාර්යය වේ)

**ලිපිනය -:**

**සභාපති,**
**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,**
**මහාධිකරණ සංකීර්ණය,**
**අළුත්කඩේ, කොළඹ 12.**